සැ. යු. -(i) 2021.08.06 වැනි දින පළ වූ අංක 2240 දරන ගැසට් පත්‍රයෙහි III, IV(අ) සහ IV (ආ) කොටස් පළ නොවීය.

(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2021 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,241 - 2021 අගෝස්තු මස 13 වැනි සිකුරාදා - 2021.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඳුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1204 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1210 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1216 |


සැ. යු. -(i) ඛනිජ තෙල් සම්පත් කෙටුම්පත 2021 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 සැප්තැම්බර් මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අගෝස්තු මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## දූරණියගල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 සහ 24(2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

2019 දෙසැම්බර් මස 05 වැනි දින පවත්වන ලද දූරණියගල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 2 (i) යටතේ සම්මත වූ යෝජනාව අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දූරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත දූරණියගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.


දූනට ප්‍රාදේශීය සභාව විසින් දක්වා ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත නිසි අධිකරණයෙහි නඩුවක් පවරා තම විරෝධතාවයන් ලිඛිතව දූරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලේඛනගත තැපෑලෙන් එවන ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. බී. ඩබ්. එල්. රාජකරුණා,
සභාපති,
දූරණියගල ප්‍රාදේශීය සභාව.

2021 ජූලි මස 22 වැනි දින,
දූරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**කොහිලදෙනිය හල්දොල ඇළෙන් මෙහොඩ ගම මැද පාර**

| *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *පාරේ අංකය* | *පාරේ නම* | *පිඹුරු අංකය* | *දුර කි. මී.* | *පළල* | *පාරේ තත්වය* | *පාර විහිදී යන ඉඩම්වල විස්තර* |
|---|---|---|---|---|---|---|---|
| අංක 114 දොඩාවත්ත | 1 | කොහිලදෙනිය හල්දොල ඇළෙන් මෙගොඩ ගම මැද පාර | බලයලත් මිනින්දෝරු තලම්තිකරු සහ උසාවි කොමසාරිස් එම්. එල්. විජේතිලක මහතා විසින් අඳින ලද 2532 අංක දරන පිඹුර | මීටර් 350 | අඩි 10 | සංවර්ධනය වෙමින් පවතින මාර්ගයක් වන අතර පාරේ වැඩි කොටසක් අඩි පාරකි | මාර්ගයේ වම්පස : <br><br> ඩී. එල්. සිරියලතා මියට අයත් හල්දොලවත්ත ඉඩම, ආර්. ඒ. සෝමවතී මියට අයත් හල්දොලවත්ත ඉඩම, එච්. පී. ජයවීර මහාට අයත් රන්වැලි කන්ද ඉඩම, ඩබ්. ජී. හර්ෂණී ප්‍රියංගිකා මියට අයත් රන්වැලි කන්ද ඉඩම, කේ.එච්. ජයසේකර මහතාට අයත් හල්දෙලවත්ත ඉඩම, කළමනාකරු නූරිවත්ත -නූරිවත්ත ඉඩම <br><br> මාර්ගයේ දකුණු පස : <br><br> එච්. ජී. නිහාල් සෝමතිලක මහතාට අයත් හල්දොළවත්ත ඉඩම, එච්. ජී. සුනිල් ප්‍රේමතිලක මහතාට අයත් හල්දොළවත්ත ඉඩම, ජේ. එම්. සන්ධ්‍යා මියට අයත් හල්දොල රක්ෂිත ඉඩම, ජී. කේ. සුමනාවතී මියට අයත් හල්දොල රක්ෂිත ඉඩම, කේ. එච්. ජයසේකර මියට අයත් හල්දොලවත්ත ඉඩම, කලමනාකරු නූරිවත්ත - නූරිවත්ත ඉඩම |


එම්.එල්.විජේතිලක
බලයලත් මිනින්දෝරු
තලම්තිකරු සහ
උසාවි කොමසාරිස්
පල්ලියපාර
දැරණියගල
T.P.036-2249622
පිඹුරු අංකය : 2532
කේ.එච්.ජයසේකරගේ
ඉඩම
පරිමාණය 1:1000
නුරිවත්ත
ආර්.ජී.සෝමාවතීගේ
ඉඩම
සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
අටුළුගම් කෝරළේ නැගෙනහිර දොඩාවත්ත ගමේ පිහිටි
හල්දොලවත්ත ගම මැද පාර පවතින ආකාරයට
(යෝජිත කොටසක්ද සහිතව) මැන පෙන්වන
පිඹුර
මායිම් :- ඉහත දැක්වෙන පරිදිය
බිම් ප්‍රමාණය :- හෙක්ටයාර 0.0944 (අ. 0 : රූ. 0 : පර. 37.3)
(පාරේ පළල අඩි 10-12 )
පාරේ තිරස් දුර :- මීටර 285.
මැනීම කළේ:- 2019-07-13
එම්. එල්. විජේතිලක
බලයලත් මිනින්දෝරු
උසාවි කොමසාරිස්
පල්ලියපාර. දැරණියගල.

## මාතලේ මහ නගර සභාව

### තාවකාලික ගෝඝාතක බලපත්‍ර සංශෝධනය කිරීම

මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරිය) 272/27 උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව 1989.01.20 වැනි දින අංක 541/17 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* 54A පිටුවේ xxiv කොටසේ (ඝාතකාගාර) 5 වන වගන්තියේ සහ 56A පිටුවේ 26 වන වගන්තිය 2021.06.28 දින පවත්වන ලද මහා නගර සභා අංක 06.1.50 සහ 06.1.61 දරන සභා සම්මුති අනුව පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිමි.

01. 54A පිටුවේ xxiv කොටසේ 5 වන වගන්තිය- ඝාතන අවසර පත්‍රයක්, එය නිකුත් කරන ලද දිනයෙන් පසු දවස් පහළොවක් සඳහා පමණක් වලංගු වන්නේය.

02. 56A පිටුවේ කොටසේ xxiv 26 වන වගන්තිය - කොමසාරිස්වරයාගෙන් විශේෂ බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස, බලපත්‍රලත් ඝාතකයකු නොවන කිසිම තැනැත්තකු විසින් මහා නගර සභා සීමාව ඇතුළත කිසි ගවයෙකු ඝාතනය කිරීම නිත්‍යානුකූල නොවන අතර, එවැනි විශේෂ බලපත්‍රයක් ලබාගන්නා යම් තැනැත්තකු විසින් ඒ බලපත්‍රයෙහි සඳහන් ස්ථානයේ දී හෝ එහි දක්වෙන කොන්දේසි යටතේ හෝ හැර ඒ ඝාතනය සිදු නොකළ යුතු ය . එවැනි විශේෂ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයක, ඝාතනය කිරීමට ඇති සතා සම්බන්ධයෙන්, (473 වැනි අධිකාරිය වන) ගවයන් හංවඩු ගැසීම, විකිණීම සහ පැවැරීම පිළිබඳ ආඥාපනතේ උපලේඛනයේ ''අ'' ආකෘතියට හා සමානව විස්තර ඇතුළත් විය යුතු අතර, ඉල්ලුම්කරුට ඒ සතා අයත් බවට ඉල්ලුම්කරුගේ ප්‍රදේශයේ පොලිස් නිලධරයකුගේ හෝ මහනගර සභා නිලධරයකුගේ හෝ ග්‍රාමසේවා නිලධරයාගේ හෝ වාර්තාවක් ඒ සමග විය යුතුය. මෙම විශේෂ බලපත්‍රය සඳහා රුපියල් පන්දහසක් (රු.5000) නොඉක්මවන ගාස්තුවක් අයකරනු ලැබේ.

එස්. ප්‍රකාශ්,
නගරාධිපති,
මහා නගර සභාව.

08-238

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2219 - 2021.03.12 වන දින *ගැසට් පත්‍රය* මගින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඉහත *ගැසට්* පත්‍ර මගින් ප්‍රදේශයේ පොදු ජනතාව මගින් හෝ මංමාවත්වලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම්, එම *ගැසට්* නිවේදන *ගැසට්* පත්‍රයේ පල වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරක ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස දැනුම් දී ඇත.

එහෙත් මෙම කාල සීමාව තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකර කිසිවෙකු ක්‍රියාකර නොමැති බැවින්, එකී *ගැසට්* නිවේදන මගින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් සියලුම මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

**ලියාපදිංචි කළ යුතු මාර්ග**

*මිනින්දෝරු සැලැස්ම රහිත :*


| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම් පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | 76 ඉඹුල්දෙණිය | හීයවල ඉහළහේන මාර්ගය | නිකාංග ගමට පිවිසෙන ප්‍රධාන මාර්ගය | ඉහළහේන වත්ත | කේ.පී.රේණුකා දමයන්ති<br>ඩී.ජී.කපිලරත්න | බී. ජී. සුනිල් ගුණතිලක<br>පී.ජී. නිලන්ත සමන් කුමාර<br>එස්.එස්.විජයවර්ධන<br>ඒ.ආර්.සමරනායක<br>කුමුදුනි රම්‍යලතා<br>එන්.ජී.ඒ.සම්පත් ජයරත්න<br>එන්.ජී.සිරිල් ජයරත්න | 100 | 05 |

**මිනින්දෝරු සැලැස්ම සහිත :**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 02 | 45 දෙල්ගහපිටිය | සමගි මාවත | කුඩා බණ්ඩා මහතාගේ නිවස අසලින් | රොෂාන් විජේරත්න මහතාගේ නිවස අසලින් | ආර්.ඩබ්.පී.ජී.ආර්. සෙනරත්<br>ගීතානී මීවතුර<br>නිරෝෂණී සමන් කුමාර<br>ටී.ආර්.දිවාකර<br>ඒ.එම්.ආර්. කුමාරිහාමි | කේ.ඒ.එම්.රෝහිත වීරකෝන්<br>ඩබ්.එම්.කුඩාබණ්ඩා<br>යූ.ජී.ආර්.එස්.දයාරත්න<br>ඩී.ජී.රොෂාන් කුමාර විජේරත්න<br>ඩී.ජී.සංජීව කුමාර විජේරත්න | 820 | 10 |
| 03 | 42 උඩඅළු-දෙණිය | උඩඅළුදෙණිය රතුකුරුස මාර්ගයේ I වෙනි පටුමග | රතුකුරුස මාර්ගයේ I වෙනි පටුමග | උඩුපිටිය වත්ත | ආර්. ඒ. බණ්ඩාරනායක<br>ආනන්ද විජේරත්න | එස්.එම්.කසුන් හිරන්ත<br>ඩබ්.කේ.ජී.ඒ.පී. නන්දසේන<br>බී. එච්. බන්දුල පුෂ්ප කුමාර | 110 | 08 |

D.A.Ratnayeke
Licensed Surveyor & Leveller
No.212/A
Polgahaange
Weligalla

PLAN No:3282




මුල් පිටපත හා සැසඳෙන බවට සහතික කරමි

Reference

| | |
|---|---|
| B | Bank |
| LF | Live Fence |
| CP | Concreet Post |
| L | Land mark |
| Road(PS) | Road(Pradeshiya-Sabawa) |

Scale : 1:2000

# PLAN

of an allotment of Land called
Part of Panderugahamulahena & Koholangodahena
Situated at Polgahaange Village
Delgahapitiya G.S.Division, Udunuwara Pradeshiya Sabawa
Gangapalata Korale of Udunuwara D.S.Division

**KANDY DISTRICT**
**CENTRAL PROVINCE**


Note.

Surveyed in: 05/08/2020

Distance from A to B..................210.0 meters

| Lot No: | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Ha. | A. | R. | Pa. | |
| 1 | 0.0650 | 0 | 0 | 25.5 | Road (10 feet wide) |
| Total | 0.0650 | 0 | 0 | 25.5 | |

D.A. Ratnayake
Registered Licensed Surveyor
No 212/A, Polgahaanga
Weligalla




## PLAN

OF

REDCROSS ROAD, 1 ST LANE

Situated at

G.N.division No. 42, Uda Aludeniya

Uda Aludeniya Village

Within the Pradeshiya sabha Limits of Udunuwara

in Gangapalatha Korale of Udunuwara D.S.Division

KANDY DISTRICT

CENTRAL PROVINCE

Containing in Extent

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| 1 | 0.0085 | 0 | 0 | 3.36 | Road (8 Feet width) |
| Total | 0.0085 | 0 | 0 | 3.36 | |

ength of "A" to "B" = 32 m (105 Feet)

Survey as the Request of Chief Incumbent of Uda Aludeniya Raja Maha Viharaya and Owners of the Land in both side of Road

Boundaries pointed out by owners of the Land in both side of road.

I.B.S. SANG...
Registered Licensed Survey...

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

### මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සභාපති කේ. තෙච්චනාමූර්ති වන මම, 2021.07.20 වැනි දින මහා සභා තීරණ අංක 5.01 අනුව ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2020.12.31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

කේ. තෙච්චනාමූර්ති,
සභාපති,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2021 ජූලි මස 20 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධාන වලට අනුකූල වන පරිදි පහත උපලේඛනවල සඳහන් පරිදි සකස් කරන ලද ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා ආදයම් වියදම් ගිණුම, 2020.12.31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2020.12.31 අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය I**

*2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් වියදම් ගිණුම*

| | | 2020 | 2019 |
|---|---|---|---|
| 1. පුනරාවර්ථන ආදායම් | | | |
| 10 | වරිපනම් හා බදු | 7,627,575.93 | 7,595,208.67 |
| 20 | කුළී | 8,351,547.01 | 7,990,282.21 |
| 30 | බලපත්‍ර ගාස්තු | 1,152,126.80 | 1,561,293.64 |
| 40 | සේවා සඳහා ගාස්තු | 12,005,133.12 | 1,307,477.67 |
| 50 | දඩ හා වරෙන්තු ගාස්තු | 8,229,611.66 | 11,125,199.94 |
| 60 | වෙනත් ආදායම් | 16,509,403.51 | 14,289,082.12 |
| 70 | ආදායම් ආධාර | 37,362,107.28 | 30,366,316.63 |
| පුනරාවර්ථන ආදායම් එකතුව | | **81,237,505.31** | **74,234,860.88** |
| 2. පුනරාවර්ථන වියදම් | | | |
| 01 | වැටුප් හා දීමනා | 42,484,050.81 | 41,207,020.87 |
| 02 | ගමන් වියදම් | 294,309.00 | 586,823.00 |
| 03 | සැපයුම් හා උපකරණ | 5,900,299.55 | 6,683,378.65 |
| 04 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 6,077,901.76 | 5,900,248.98 |
| 05 | ප්‍රවාහන, සම්බන්ධතා හා සේවා | 3,957,263.73 | 8,621,299.10 |

| | | 2020 | 2019 |
|---|---|---|---|
| 06 | පොළී ගෙවීම් හා ලාභාංශ | 0.00 | 6,162.83 |
| 07 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 1,232,496.44 | 770,833.10 |
| 08 | විශ්‍රාම වැටුප් හා විශ්‍රාම පාරිතෝෂික | 265,610.86 | 641,155.63 |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | | **60,211,932.15** | **64,416,922.16** |
| **පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ/අඩු වූ ආදායම හා වියදම** | | **21,025,573.16** | **9,817,938.72** |
| **3. ප්‍රාග්ධන වියදම්** | | | |
| 80 | මූලධන ආධාර | 20,000.00 | 525,000.00 |
| **පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම සහ ප්‍රාග්ධන ආදායම** | | 21,045,573.16 | 10,342,938.72 |
| **4. ප්‍රාග්ධන වියදම්** | | | |
| 09 | උපකරණ වැය | 5,900,803.78 | 13,641,468.96 |
| **අතිරික්තය හෝ ඌනතාවය** | | **15,144,769.38** | **-3,298,530.24** |

## උපලේඛන II

### *2020.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය*

| **වත්කම්** | **සටහන** | **2020.12.31** | **2019.12.31** |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 06 | 216,560,495.98 | 210,786,789.74 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 07 | 1,734,989.41 | 1,434,757.89 |
| ආදායම් ණය ගැතියෝ | 08 | 68,183,023.17 | 75,842,062.45 |
| සේවක ණය හා අත්තිකාරම් | 09 | 7,687,345.12 | 7,791,835.49 |
| ආයෝජන | 10 | 13,864,787.75 | 15,921,409.85 |
| මුදල් සහ මුදල් හා සමාන දේවල් | 11 | 14,481,541.78 | 6,787,055.64 |
| ලැබිය යුතු ආදයම් | | 33,930.09 | 0.00 |
| | | **105,985,617.32** | **107,777,121.32** |
| **මුළු වත්කම්** | | **322,546,113.30** | **318,563,911.06** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| හිමිකම් | 12 | 303,212,187.53 | 283,410,614.09 |
| | | 303,212,187.53 | 283,410,614.09 |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | 13 | 19,333,925.77 | 35,153,296.97 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **322,546,113.30** | **318,563,911.06** |

## උපලේඛන III

*2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය*

| | 2020.12.31 | 2019.12.31 |
|---|---|---|
| *මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය* | | |
| සාමාන්‍ය මෙහෙයුම්වලින් ලද අතිරික්තය/ඌනතාවය | 21,025,573.16 | 9,817,938.81 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපුම් | - | - |
| ක්ෂය වීම්/පොළී | - | - |
| පාරිතෝෂික වෙන්කිරීම් | - | - |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | (1,116,902.18) | 1,810,406.42 |
| | | |
| *කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය* | **19,908,670.98** | **11,628,345.23** |
| තොග ණයගැතියන්/අනෙකුත් ලැබීම් (වැඩිවීම්)/අඩුවීම් | 7,429,368,04 | (8,785,615.07) |
| ණයහිමියන්/ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | (15,819,371.20) | 23,219,580.38 |
| | | |
| 01. මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **11,518,667.82** | **26,062,310.54** |
| *ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය* | | |
| දේපළ (අත්පත් කර ගැනීම්)/විකිණීම් | | |
| ආයෝජන | 2,056,622.10 | (10,556,162.78) |
| ප්‍රාග්ධන වියදම් | (5,900,803.78) | (13,641,468.96) |
| | | |
| 02. ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **(3,844,181.68)** | **(24,197,631.74)** |
| *මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය* | | |
| ප්‍රාග්ධන ලැබීම් | 20,000.00 | 525,000.00 |
| ණය ගැනීම/(ආපසු ගෙවීම්) | | |
| | | |
| 03. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 20,000 .00 | 525,000.00 |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් (1+2+3) | 7,694,486.14 | 2,389,678.80 |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | 6,787,055.64 | 4,397,376.84 |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 11) | **14,481,541,78** | **6,787,055.64** |
| සටහන 11 | | |
| මහජන බැංකුව - හලාවත | | |
| පොදු ගිණුම - 24100150863528 | 14,003,630.39 | 6,691,991.11 |
| සේවක ණය ගිණුම - 24100240863528 | 477,911.39 | 95,064.53 |
| අතැති මුදල් | **14,481,541.78** | **6,787,055.64** |

08-171

## බිංගිරිය ප්‍රාදේශීය සභාව

### මුල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත්කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධාන වලට අනුකූලවන පරිදි පහත උපලේඛනවල සඳහන් විගණනය කිරීමට නියමිත බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2020.12.31 වැනි දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත්කරමි.

ඒ. ඒ. ජයසිරි,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

2021 මැයි 03 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභාවේදී ය.

### උපලේඛන I

**2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය**

| | *සටහන්* | *2020.12.31* | *2019.12.31* |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | |
| රජයේ දායකය | 01 | | |
| පුනරාවර්තන | | 48,560,614.82 | 46,370.309.05 |
| ආදායම | 02 | 42,651,258.52 | 55,008,918.30 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | **91,211,873.34** | **101,379,227.35** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුනරාවර්තන වියදම් | 03 | 86,820,807.19 | 82,484,581.50 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **86,820,807.19** | **82,484,581.05** |
| **වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය** | | **4,391,066.15** | **18,894,645.85** |
| ප්‍රාග්ධන ලැබීම් | 04 | 56,607,509.81 | 18,236,238.54 |
| ප්‍රාග්ධන වියදම් | 05 | 86,343,450.96 | 35,673,186.50 |
| **වර්ෂය සඳහා අතිරික්තය/ඌනතාවය** | | **(25,344,875.00)** | **1,457,697,89** |

උපලේඛන II

*2020 දෙසැම්බර් මස 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය*

| | සටහන් | 2020.12.31 | 2019.12.31 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 06 | 292,323,167.05 | 293,712,253.12 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 07 | 4,277,996.94 | 3,982,089.89 |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 10,718,822.54 | 11,561,282.22 |
| ලැබිය යුතු දෑ | 09 | 68,233,333.56 | 65,196,994.68 |
| පෙර ගෙවුම් | 10 | 92,290.60 | 694,205.53 |
| ආයෝජන | 11 | 20,481,528.78 | 13,998,178.77 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 12 | 1,831,178.74 | 7,180,13.41 |
| | | 105,635,151.16 | 102,612,890.50 |
| **මුළු වත්කම්** | | **397,958,318.21** | **396,325,143.62** |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 3,180,678.55 | 4,569,487.57 |
| ජංගම වගකීම් | 13 | 98,359,944.98 | 50,715,508.33 |
| හිමිකම් | 14 | 296,417,694.68 | 341,040,147.72 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **397,958,318.21** | **396,325,143.62** |

උපලේඛන III

*2020 දෙසැම්බර් මස 31 දිනට අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය*

| | |
|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය<br>සාමාන්‍ය මෙහෙයුම්වලින් ලද අතිරික්තය/ඌණතාවය | 4,391,066.15 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම්<br>ක්ෂය වීම්<br>පාරිතෝෂික වෙන් කිරීම්<br>පෙර වර්ෂ සඳහා ගැලපීම්<br>කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය | <br><br>-17,889,001.97<br>**-13,497,935.82** |

| | |
|---|---|
| තොග ණය ගැතියන්/අනෙකුත් ලැබීම්(වැඩිවීම්) අඩුවීම් | -8,371,221.33 |
| ණය හිමියන් ගෙවිය යුතු දෑ වැඩිවීම (අඩුවීම) | 46,255,627.63 |
| **01. මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **24,386,470.48** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | |
| දේපළ අත්පත් කර ගැනීම්/ඉවත් කිරීම් | |
| ප්‍රාග්ධන වියදම් | - 86,343,450.96 |
| **02. ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **- 86,343,450.96** |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | |
| ප්‍රාග්ධන ලැබීම් | 56,607,509.81 |
| ණය ආපසු ගෙවීම් | |
| **03. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **56,607,509.81** |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් (1 + 2 + 3) | - 5,348,960.67 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 7,180,139.41 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ සටහන 'A' | 1,831,178.74 |
| සටහන A | |
| ලංකා බැංකුව - ජංගම ගිණුම (පොදු) | 1,831,178.74 |

08-211

# විවිධ දැන්වීම්

**මාතලේ මහ නගර සභාව**

වාහන නවතා තැබීම සඳහා අය කරන ගාස්තු

මහ නගර සභා ආඥාපනතේ 267(1) හා 272 (6) වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව, 1989 ජනවාරි මස 20 වැනි දින අංක 541/17 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ XVIII වැනි කොටසේ II බාණ්ඩයේ 9 (අ) වගන්තියේ දැක්වෙන පරිදි පහත උපලේඛනයේ සඳහන් පරිදි මාතලේ මහ නගර සභා සීමාවේ වාහන නතර කර තැබීමේ අවසරපත් ගාස්තු 2021 වර්ෂයේ ජූලි මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 06.1.50 යටතේ තීරණය කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. ප්‍රකාශ්,
නගරාධිපති,
මාතලේ මහ නගර සභාව.

2021 ජූලි මස 14 වැනි දින,
මාතලේ මහ නගර සභා කාර්යාලයේ දී ය.

**වාහන නවතා තැබීමේ ගාස්තු**

i. යතුරු පැදි සඳහා පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 20.00 ක් බැගින් සහ ඉන් පසු වැඩි වන සෑම පැයකට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 10.00 ක් බැගින්

ii. ත්‍රීරෝද රථ සඳහා දිනකට (බදු සහිතව) රු. 50.00 ක් බැගින්

iii. මෝටර් රථ කැබ් රථ, වෑන් රථ, ජීප් රථ සඳහා පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 50.00 ක් බැගින් සහ ඉන් පසු වැඩි වන සෑම පැයකට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 20.00 බැගින්

iv. බස් රථ, ලොරි රථ, ට්‍රක් රථ සඳහා පළමු පැයට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 100.00 ක් බැගින් සහ ඉන් පසු වැඩි වන සෑම පැයකට හෝ ඉන් කොටසකට (බදු සහිතව) රු. 100.00 ක් බැගින්

v. පාසල් බස් රථ සඳහා දිනකට රු. 100.00 ක් බැගින්

vi. ප්‍රධාන වීදිවල නිවාස හිමි අයගේ වාහන නැවතුම් ගාස්තු ලෙස මාසිකව රු. 1,500.00 ක් බැගින් (දෛනිකව රු. 50.00 බැගින්)

* ඉහත වීදිවල අනුමත ත්‍රීරෝද රථ ගාල්වල නතර කරන කුලී රථ සහ ත්‍රීරෝද රථ ගාල්වල ගාස්තු අය කළ යුතුය.

මෙහි සඳහන් සියලුම ගාස්තු අය කිරීමේ දී අදාළ ගාස්තුවට අමතරව, රජයේ අනුමත බදු මුදල් අයකරනු ලැබේ.

08-239

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.